// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,551 - 2008 මැයි මස 23 වැනි සිකුරාදා - 2008.05.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 568 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 575 |

*සැ. යු.-* (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2008 මාර්තු මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2008 මාර්තු මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මැයි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 මැයි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

565- B 079905 —9,435 (2008/04)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්විම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

## තනතුරු - ඇබෑර්තු

### සෞඛ්‍ය ආරක්‍ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ පාසැල් දන්ත චිකිත්සක පුහුණුව සඳහා සිසුවියන් බඳවා ගැනීම

සෞඛ්‍ය ආරක්‍ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ පාසැල් දන්ත චිකිත්සක පුහුණුව සඳහා සිසුවියන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසි කාන්තාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 2003 සිට 2006 දක්වා විද්‍යා අංශයෙන් අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ලබාගන්නා ලද Z අගය අනුව සකස්කළ ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගනිමින් සුදුසුකම් ලැබූවන් පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

02. මීට ප්‍රථම 2007.12.28 දිනැති *ගැසට් නිවේදනය* අනුව නිසි පරිදි අයදුම්පත් ඉදිරිපත් නොකළ අයදුම්කරුවන්ට ද මේ සඳහා අයදුම් කළ හැකිය.

2.1 අදාළ දිස්ත්‍රික්ක හා පවත්නා පුරප්පාඩු පහත දක්වා ඇත.

| *දිස්ත්‍රික්කය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| ගම්පහ | 20 |
| කළුතර | 13 |
| මහනුවර | 04 |
| මාතලේ | 03 |
| නුවරඑළිය | 03 |
| ගාල්ල/මාතර/හම්බන්තොට | 15 |
| පුත්තලම | 03 |
| අනුරාධපුර | 10 |
| පොළොන්නරුව | 04 |
| යාපනය | 01 |
| මුලතිව් | 02 |
| මන්නාරම් | 01 |
| කිලිනොච්චි | 02 |
| කල්මුණේ | 05 |
| අම්පාර | 01 |
| මඩකලපුව | 02 |
| ත්‍රිකුණාමලය | 04 |
| බදුල්ල | 09 |
| මොණරාගල | 08 |
| රත්නපුර | 04 |
| කෑගල්ල | 03 |

2.2 2007.12.28 දිනැති *ගැසට් නිවේදනය* අනුව අයදුම්කරුවන් තෝරා ගැනීමේදී ද මෙම පුරප්පාඩු පදනම් කරගනු ඇත.

03. මෙම පාඨමාලාව පූර්ණ කාලීන පාඨමාලාවක් බැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ වෙනත් පාඨමාලා හදාරන සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් නොකළ යුතුයි.

04. පුහුණු කාලය වසර දෙකකි.

05. *අධ්‍යාපන සුදුසුකම් :*

5.1 අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් හයකින් සමත් විය යුතුය.

5.2 2003 සිට 2006 දක්වා අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි විද්‍යා විෂයය ධාරාවන්ගෙන් අවම වශයෙන් ජීව විද්‍යා විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව තවත් විෂයන් දෙකකින් එකවර සමත්වී තිබීම. අයදුම්පතෙහි අ. පො. ස. (උ. පෙළ) විභාගයේ Z අගය ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

06. *අනෙකුත් සුදුසුකම් :*

(අ) උස අඩි 4 අඟල් 10ට වැඩි කාන්තා පක්ෂයේ විය යුතුයි.
(ආ) අවිවාහක විය යුතුය. පුහුණු කාලය තුළ අවිවාහකව සිටිය යුතුය.
(ඇ) 2008.06.16 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(ඈ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුයි.
(ඉ) මනා ශාරීරික සෞඛ්‍යකින් යුක්ත විය යුතුයි.
(ඊ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අවුරුදු තුනක් පදිංචිව සිටිය යුතුය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මේ සමඟ ඇති ආකෘතිපත්‍රය අනුව අයදුම්පතක් සකස් කර ගත යුතුවේ. අයදුම්පතේ "මුද්දර" යන ස්ථානයේ රුපියල් 500 ක මුද්දරයක් අලවා තම අත්සන යොදා එය අවලංගු කළ යුතුවේ.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ /රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 1,24,080කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුවේ.

(ඇ) අයදුම්පත් නිසිපරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙලවරේ "පාසැල් දන්ත චිකිත්සක තනතුරු සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කොට 2008.06.16 දින හෝ ඊට පෙර "අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, 'සුවසිරිපාය', 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08. අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලැබේ.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ඉහත අධ්‍යාපන සුදුසුකම් සහ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති නිසි පරිදි අයදුම්පත්‍ර එවූ අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සහතික මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂිකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඉ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ මුල් සහතික නිකුත් කර නැති විට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය හෝ අයදුම්කරු විභාගයට පෙනී සිටි විද්‍යාලයේ විදුහල්පතිවරයා නිකුත් කළ මුල් ලිපිය යනාදී ලිපි ලේඛන.

(ඇ) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සහතිකය

(ඈ) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය

(ඉ) අවිවාහක බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන යෙදූ ග්‍රාම සේවා සහතිකය

(ඊ) දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03කට පදිංචිය සනාථ කිරීම සඳහා 2003 සිට 2006 දක්වා ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපත්, අයදුම්කරුගේ නම ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව නොමැති නම්, ඔහුගේ දෙමාපියන්ගේ නම් ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව තිබිය යුතුය.එවැනි අයදුම්කරුවන් විසින් ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපතට අමතරව ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම සේවා නිලධාරියාගෙන් ලබාගත් පදිංචිය පිළිබඳව සහතිකය ඉදිරිපත් කළ යුතුය.

12. *පුහුණු කිරීමේ පරිපාටිය* :

(අ) තෝරාගත් අයදුම්කරුවන් ඉහත පුහුණුව සඳහා මහරගම පුහුණු පාසැලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුවේ.

(ආ) පුහුණුව සඳහා ඇතුළත් කරන සිසුවියන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටු දායක නොවන හෝ පුහුණු පාසලෙහි කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කරනු ඇත.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ සිසුන්ට මාසිකව රු. 6,000 දීමනාවක් ගෙවනු ලැබේ. මීට අමතරව ජීවන වියදම් දීමනාව ද හිමිවේ.

(ඉ) පුහුණු පාසැලට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව පත්වීම් ලැබුවහොත් අවම වශයෙන් අවුරුදු 10 ක කාල පරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් ඉහත (ඇ) ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද වියහියදම් සඳහා වැයවූ මුදල ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. එසේ නොවුවහොත් ගිවිසුම් ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

13. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :

පුහුණුව අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රධානය කිරීමට ද රජය බැඳී නොසිටී. එහෙත් බඳවා ගනු ලබන පළාතේ පුරප්පාඩු මත අවසන් පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂිකාවන්ට දෙපාර්තමේන්තුව මඟින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කරගනිමින් අදාළ තනතුරේ III පංතියේ තනතුරු සඳහා පත්කරනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර දෙකක් මුල් පත්වීමේ ස්ථානයේ රැඳී සිටීම අනිවාර්ය වේ.

14. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර නැවත රාජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

15. තෝරාගත් අයදුම්කාරිය අදාළ පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

16. ඉහත පරිදි බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් රජයේ සේවකයන් ලෙස අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත්වනු ඇත.

17. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මඟින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත උවහොත් ඒ පිළිබඳ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2008 මැයි මස 02 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අයදුම් පත්‍රය

**සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය**

***අතුරු වෛද්‍ය සේවාවේ පාසල් දන්ත චිකිත්සක පුහුණුව සඳහා සිසුවියන් බඳවා ගැනීම***

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———.

03. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ii) දිස්ත්‍රික්කය

(iii) ඔබ මෙම දිස්ත්‍රික්කයයේ ස්ථිර පදිංචි කරුවෙක් ද? ඔව්/නැත

(iv) 'ඔව්' නම් කොපමණ කලක පටන් ද? :

04. උපන් දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.

2008.06.16 දිනට වයස ඃ අවුරුදු :———. මාස :———. දින :———.

05. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුවේ " ✓ " යොදන්න)

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

06. උස : අඩි :———. අඟල් :———.

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග (අදළ කොටුවේ " ✓ " යොදන්න)

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

08. ජාතික හැඳුනුම්පත් අංකය :———.

09. විවාහක අවිවාහක බව :———.

10. අධ්‍යාපන සුදුසුකම්

(අ) අ. පො. ස. (උ. පෙළ) විභාගය, (විද්‍යා විෂයන් පමණි)
(ලකුණු සටහන් පිටපත අමුණන්න)
විභාගයට ඉදිරිපත් වූ දිනය :———.
වර්ෂය :———. විභාග අංකය :———.
Z ලකුණ :———.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය :———.
පළමු වාරය
වර්ෂය :———. විභාග අංකය :———.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 07. | |
| 02. | | 08. | |
| 03. | | 09. | |
| 04. | | 10. | |
| 05. | | 11. | |
| 06. | | 12. | |

දෙවන වාරය

වර්ෂය :———. විභාග අංකය :———.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 07. | |
| 02. | | 08. | |
| 03. | | 09. | |
| 04. | | 10. | |
| 05. | | 11. | |
| 06. | | 12. | |

11. උසාවියක ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරුවී ඇත් ද ?
(අදාළ කොටුවේ " ✓ "යොදන්න)

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

'ඔව්' නම් විස්තර සපයන්න. :———.

12. අයදුම්කරුගේ සහතිකය ඃ

(අ) මම වෙනත් කිසිඳු පූර්ණ කාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත් මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) ම විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මම දැන සිටිමි.

මුද්දර කොටුව

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................. මා පෞද්ගලිකව හඳුනන බවත් ඇය 2008 .................. වැනි දින මා ඉදිරිපිට දී ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

———,
සහතික කරන්නාගේ අත්සන
නිල මුද්‍රාව සහිතව.

දිනය :———.

සහතික කරන නිලධාරියාගේ :

සම්පූර්ණ නම :———,
තනතුර :———,
ලිපිනය :———.

05-358

**සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවාවන්හි පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2008

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවාවේ පාඨමාලාවන් සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 2001 වර්ෂයේ සිට 2006 දක්වා අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී ලබා ගන්නා ලද Z අගය අනුව ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කර ගනිමින් සුදුස්සන් තෝරාගනු ලැබේ. සුදුසුකම් අනුව පාඨමාලාවන් තෝරා ගැනීම සඳහා අයදුම්කරුවන්ට අවස්ථාව ඇත. එක් තනතුරකට වඩා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

02. පුහුණු පාඨමාලාවට බඳවාගත හැකි සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාතය පදනම් කර ගනිමින් සිසුන් පාඨමාලාවන් සඳහා තෝරා ගනු ලැබේ.

03. මෙම පාඨමාලා පූර්ණකාලීන පාඨමාලාවන් බැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ වෙනත් පාඨමාලා හදාරන සිසුන් මෙම පාඨමාලා සඳහා අයදුම් නොකළ යුතුය.

04. අදාල පාඨමාලාව සහ පුහුණු කාලය පහත දක්වා ඇත. :

| *සංකේත අංකය* | *පාඨමාලාව* | *පුහුණු කාලය* |
|---|---|---|
| 01 | ඖෂධවේදී | අවුරුදු 02 යි. |
| 02 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | අවුරුදු 02 යි. |
| 03 | භෞත චිකිත්සක | අවුරුදු 02 යි. |
| 04 | චිකිත්සීය විකිරණ ශිල්පී | අවුරුදු 02 යි. |
| 05 | රෝග විනිශ්චය කරනු ලබන විකිරණ ශිල්පී | අවුරුදු 02 යි. |

05. *අධ්‍යාපන සුදුසුකම්* :-2001 සිට 2006 දක්වා අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට විද්‍යා විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් එකවර සමත්වී තිබීම හා එක් එක් පාඨමාලාවන් වෙනුවෙන් අපේක්ෂිත විද්‍යා විෂයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අනිවාර්ය වෙ. පාඨමාලාවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් පහත සඳහන් පරිදි වේ :

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | *අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම්* | *අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම්* |
|---|---|---|---|
| 01<br>02 | ඖෂධවේදී<br>වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයන් දෙකක් එකවර සමත්වීම | සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) සමත්වීම |
| 03<br>04<br>05 | භෞත චිකිත්සක<br>චිකිත්සීය විකිරණ ශිල්පී<br>රෝග විනිශ්චය කරනු ලබන විකිරණ ශිල්පී | අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයන් දෙකක් එකවර සමත්වීම | සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) සමත්වීම |

06. *අනෙකුත් සුදුසුකම්* :-

(අ) 2008.06.30 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි වියයුතුය.
(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.
(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය* :-

(අ) මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පතක් සකස් කර ගත යුතුවේ. අයදුම්පතේ 'මුද්දර' යන ස්ථානයේ රුපියල් 500ක මුද්දරයක් අලවා තම අත්සන යොදා එය අවලංගු කළ යුතුවේ.

(ආ) තනතුරු කිහිපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ /රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු /නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 1,24,080 කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුවේ.

(ඈ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලවන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුරු නාමය සඳහන් කොට 2008.06.30 දින හෝ ඊට පෙර ලැබෙනසේ අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, සුවසිරිපාය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08. රජයේ හෝ අර්ධ රජයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

09. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

11. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. ඉහත අධ්‍යාපන සහ අනෙකුත් සපුරා ඇති අපේක්ෂක/ අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල

මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය සහතික මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ :

(අ) උප්පැන්න සහතිකය;

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික හෝ සහතික නිකුත් කර නැති විට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ හෝ අයදුම්කරු විභාගයට පෙනීසිටි විදුහලේ විදුහල්පතිවරයා විසින් නිකුත් කළ මුල් ලිපිය යනාදී ලිපිලේඛන;

(ඇ) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ.පො.ස. (උ.පෙළ) ලකුණු මට්ටම සඳහන් සහතිකය;

(ඈ) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය;

(ඉ) දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03කට පදිංචිය සනාථ කිරීම සඳහා 2001 සිට 2006 දක්වා ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපත්, අයදුම්කරුගේ නම ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව නොමැති නම්, ඔවුන්ගේ දෙමාපියන්ගේ නම් ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව තිබිය යුතුය. එවැනි අයදුම්කරුවන් විසින් ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපතට අමතරව ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාමසේවා නිලධාරියාගෙන් ලබාගත් පදිංචිය පිළිබඳව සහතිකය ඉදිරිපත් කළ යුතුය.

13. පුහුණු කිරීමේ පටිපාටිය :-

(i) තෝරාගත් අයදුම්කරුවන් ඉහත 04 ඡේදයේ අදාල පාඨමාලාව සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුවේ.

(ii) පුහුණුව සඳහා ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසැල්වල බල පැවැත්වෙන නීතිරීති වලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කළින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලටද යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාග වලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ තමන් ඇතුළත් කරගනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවකදී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

(iv) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට රුපියල් 6000ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුළත් වන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත් එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව, පත්වීම් ලැබුණහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් ඉහත III ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද වියහියදම් සඳහා වැය වූ මුදල ඔහු/ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. එසේ නොවුවහොත් ගිවිසුම් ප්‍රකාරව එම මුදල අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

14. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් .*—පුහුණුව අවසානයේදී ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට ද රජය බැඳී නොසිටී. එහෙත් දිවයිනේ ඕනෑම පළාතක ඇතිවන පුරප්පාඩු මත අවසන් පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දෙපාර්තමේන්තුව මඟින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කරගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු ඇතිවූ විට අදාල තනතුරේ III පංතියේ තනතුරු සඳහා පත්කිරීම සලකා බලනු ලැබේ.

15. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ /ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

16. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

17. ඉහත පරිදි බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ටද යටත්වනු ඇත.

18. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට් නිවේදනය* මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2008 මැයි මස 08 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය**

***වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවාවේ පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2008***

*අයදුම්කරන තනතුර* :————.

01. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. තැපැල් ලිපිනය :

*සිංහලෙන්/දෙමළෙන්* :—————. *ඉංග්‍රීසියෙන්* :—————.

04. (අ) ස්ථිර ලිපිනය :

*සිංහලෙන්/දෙමළෙන්* :—————. *ඉංග්‍රීසියෙන්* :—————.

(ආ) දිස්ත්‍රික්කය :—————.

(ඇ) ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක්ද ?

ඔව්/නැත :—————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන් ද? :—————.

05. උපන් දිනය :

වර්ෂය :————. මාසය :————. දිනය :————.

2008.06.30 දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

06. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාල අක්ෂරය කොටුව තුළ ලියන්න)

ස්ත්‍රී - F

පුරුෂ - M

| |
|---|
| |

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

08. විවාහක/අවිවාහක බව :—————.

09. අධ්‍යාපන සුදුසුකම්

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාගය (විද්‍යා විෂයයන් පමණි) (ලකුණු සටහන් පිටපත් අමුණන්න)

විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :—————.

විභාගයේ වර්ෂය :—————.

විභාග අංකය :—————.

Z අගය :—————.

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

(ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගය - පළමු වර :

විභාගයේ වර්ෂය :—————.

විභාග අංකය :—————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ.පො.ස. (සා.පෙළ,) විභාගය - දෙවන වර :

විභාගයේ වර්ෂය :—————.

විභාග අංකය :—————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේද ?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න :—————.

11. අයදුම්කරුගේ සහතිකය :

(අ) මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවටත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු

එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

මුද්දර කොටුව

————.
අයැදුම්කරුගේ අත්සන

දිනය :————.

12. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී 2008......... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————.
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

05-427

---

## පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

### පිළිගැනීමේ නිලධාරි තනතුර

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ඉහත සඳහන් තනතුර සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ පළකර තිබෙන ආදර්ශ ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයැදුම්පත් 2008 ජූනි මස 13 දිනට හෝ ඊට පෙර ලැබෙනසේ ලේකම්, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, අංක 464බී, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කර නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයැදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''පිළිගැනීමේ නිලධාරි තනතුර'' යනුවෙන් සඳහන් කළ යුතුය.

01. තනතුරු නාමය :
පිළිගැනීමේ නිලධාරි තනතුර

02. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

සිංහල/දෙමළ/භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ ශුද්ධ ගණිතය/මූලික ගණිතය හා ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 04කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විෂයයන් 06කින් සමත්විය යුතුය. (එක් වරක දී විෂයයන් 05කින් සමත්විය යුතුය.)

හෝ;

සිංහල/දෙමළ භාෂාව, ගණිතය, ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 04කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විෂයයන් 6කින් සමත්විය යුතුය. (එක් වරකදී විෂයයන් 05කින් සමත්විය යුතුය.)

හෝ;

සිංහල/දෙමළ භාෂාව, ගණිතය, ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 04කට ඒ හෝ බී ශ්‍රේණියේ සාමාර්ථයන් සහිතව ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගය විෂයයන් 06කින් සමත්විය යුතුය. (එක්වරකදී විෂයයන් 05ක්වත් සමත්විය යුතුය.)

සහ;

මාධ්‍ය භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් පැහැදිලිව අදහස් ප්‍රකාශ කළහැකි විය යුතු මෙන්ම භාෂාව තේරුම් ගැනීමේ හැකියාව තිබිය යුතුවේ. දෙමළ භාෂාව අයැදුම්කරුවන්ගේ මාධ්‍ය භාෂාව නොවන්නේ නම් ඒ පිළිබඳ ව්‍යවහාර දැනුමක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

03. වෘත්තීය සුදුසුකම් :

රජයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 2ක පළපුරුද්ද ලබා තිබීම (සහතික මගින් සනාථ කළ යුතුය.)

04. මාසික වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6-2006 (IV) හි MN1-2006A වැටුප් කාණ්ඩය අදාළ වේ. 13,120-10x145-11x170-10x240-10x320-22,040

05. වයස් සීමාව :

අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට අයැදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බලනොපායි)

06. සේවය නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) ආයතන සංග්‍රහයේ සැසි පරිච්ඡේදයේ 10-12 දක්වා ඡේදවල විධිවිධාන ද අදාළ වේ.

(iii) තනතුරට පත්වීමෙන් පසු වසර 05ක් ඇතුළත 2007.05.28 දිනැති රා.පරි. චක්‍රලේඛ 7/2007 හි විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහිදී ඉහළම ලකුණු ලබාගත් අය අතරින් සුදුස්සෙකු තෝරාගනු ලැබේ.

08. *වෙනත් කරුණු.*— දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරන්නන් තම අයැදුම්පත් දෙපාර්තමේන්තුවෙන් හෝ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

සීතා විතානආරච්චි,
ලේකම්,
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,

අංක 464බී,
පන්නිපිටිය පාර, පැලවත්ත,
බත්තරමුල්ල.

**පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

***පිළිගැනීමේ නිලධාරි තනතුරට බඳවා ගැනීමේ අයැදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම (මයා/මෙනවිය/මිය) :————.
02. සම්පූර්ණ නම :————.
03. ස්ථිර ලිපිනය :————.
04. තැපැල් ලිපිනය :————.
05. දැනට සේවයේ යෙදී සිටී නම් ආයතනයේ නම :————.
    ලිපිනය :————.
    තනතුර :————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. ස්ත්‍රී/පුරුෂභාවය :————.
08. (i) උපන් දිනය :————.

| අවුරුද්ද | | | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

(ii) 2008.06.13 දිනට වයස :————.

| අවුරුදු | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

09. විවාහක/අවිවාහක බව :————.
10. අධ්‍යාපන සුදුසුකම් :————.

| *අ.පො.ස. (සා.පෙළ)* | | | *අ.පො.ස. (උ.පෙළ)* | | |
|---|---|---|---|---|---|
| *වර්ෂය* | *විෂයයන්* | *ලැබූ සාමාර්ථය* | *වර්ෂය* | *විෂයයන්* | *ලැබූ සාමාර්ථය* |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |
| ………… | ………… | ……… | ………… | ………… | ……… |

11. වෙනත් සුදුසුකම් :
    (i) ————.
    (ii) ————.
    (iii) ————.

12. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද :
    ආයතනය :————.
    ————. සිට ————. දක්වා

13. අයැදුම්කරුගේ/අයැදුම්කාරියගේ සහතිකය :

.......................... වන මම ඉහත සඳහන් සියළුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. යම් හෙයකින් ඉහත තොරතුරු අසත්‍ය බව හෝ වැරදි බව සනාථ වුවහොත්, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ හිමිකම අහිමිවන බව හා තනතුර සඳහා බඳවා ගැනීමෙන් පසුව සනාථ වුවහොත්, කිසිදු වන්දියක් රහිතව තනතුරෙන් පහ කිරීමට යටත් බව බව ද මම දනිමි.

————.
අයැදුම්කරුගේ අත්සන

දිනය :————.

14. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරුවන ............ මහතා/මෙනවිය/මිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............ ................. වශයෙන් ස්ථිර තාවකාලික /අනියම්/පුහුණු නිලධාරියෙකු/ නිලධාරිණියක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය කිසිදු විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කර නොමැති බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු හෝ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————.
දෙපාර්තමේන්තුවේ/ආයතන
ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :————.

තනතුර :————.

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව ආයතනය:————.

05-438

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සමෘද්ධි කළමනාකරුවන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2006(2008)**

01. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි කළමනාකරුවන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී 2008 අගෝස්තු මස පවත්වනු ලැබේ.

02. විභාග පරිපාටිය හා විෂය නිර්දේශය

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වන අතර, නියමිත ප්‍රශ්න පත්‍ර 02 කි. කාලය එක් ප්‍රශ්න පත්‍රයකට පැය 03 බැගිනි. මුළු ලකුණු එක් ප්‍රශ්න පත්‍රයකට 100 ක් බැගින් වන අතර, සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ගණන 40 කි. සියලුම විෂයන් සඳහා එකම වාරයක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

පළමුවැනි ප්‍රශ්න පත්‍රය - විෂය අංක 01 - ආර්ථික සංවර්ධන, වානිජ හා බැංකු කටයුතු

i. ආර්ථික සංවර්ධන හා
ii. වානිජ හා බැංකු කටයුතු

දෙවැනි ප්‍රශ්න පත්‍රය - විෂය අංක 02 - ආයතන සංග්‍රහය - මුදල් රෙගුලාසි හා කාර්යාල ක්‍රම

i. ආයතන සංග්‍රහය - (I, II, III, IV, VII, XII, XIV, XV, XXV)
ii. මුදල් රෙගුලාසි ( I, II, III, XIII පරිච්ඡේද)
iii. කාර්යාල ක්‍රම

(කාර්යාල ක්‍රම වැදගත්කම. මූලධර්ම, ලැබෙන ලියුම් හා පිටත යැවෙන ලියුම් පිළිබඳ ක්‍රියා කිරීම, ලිපිගොනුවල සටහන් ලිවීම, මහජනයා සමග කටයුතු කිරීම පිළිබඳ අවබෝධය)

03. මෙම පරීක්ෂණය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. පරීක්ෂණ සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයැදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් විසින් ස්වකීය අයැදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුයි. අයැදුම්පත්‍රය පිළියෙල කර ගත යුත්තේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පමණි. අයැදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 6.0 තෙක් පළමුවැනි පිටුවට ද ඉතිරිය 2 වැනි පිටුවලට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයැදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

04. අයැදුම්පත්‍රය තම ආයතන ප්‍රධානියා මගින් (දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අනුයුක්ත වන්නේ නම් එහි දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් මගින්, 2008 ජූලි 04 දිනට හෝ ඊට පෙර නියෝජ්‍ය විභාග කොමසාරිස්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ අයැදුම්කරන විභාගයේ නම් සඳහන් කළ යුතුය. විභාගය සඳහා වූ අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තම අයැදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව පිළියෙල කරගත හැකිය.

05. යම් අපේක්ෂකයෙකුට විභාගයට යටත් පිරිසෙයින් දින හතකට කලින් තමාගේ ප්‍රවේශපත්‍රය නොලැබුනහොත්, ඔහු විසින් ඒ බව අප්‍රමාදව පහත දැක්වෙන තොරතුරු සමග බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම්දිය යුතුය. විදුලි පණිවිඩ යන ලිපිනය "විභාග, බත්තරමුල්ල."

අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයැදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයන්ද ඔබගේ ඉල්ලීම් ලිපිය ද ලඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

විභාගයේ නම් :———.

අයැදුම්කරුගේ සම්පූර්ණ නම :———.

අයැදුම්කරුගේ ලිපිනය :———.

ඉල්ලුම්පත්‍රය තැපැල් කළ කාර්යාලය :———.

ලියාපදිංචි අංකය හා දිනය :———.

06. අනන්‍යතාව අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගැනේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කර ලද ජාතික හැඳුනුම්පත්‍රය

2. වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය)

07. මෙම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. මෙම විභාගයට පෙනී සිටීමට අයැදුම්පත්‍ර එවා ඇති සියලු දෙනාට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබන අතර, ඔවුන්ට තමන්ගේ කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතුය.

09. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ලැබේ.

———.

නීතිඥ ආර්. පී. බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකරිය,
04 වෙනි මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

## සමෘද්ධි කළමනාකරුවන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2006(2008)

## First Efficiency Bar Examination for Samurdhi Managers - 2006 (2008)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය - [ ]     [ ] කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

සිංහල -2, දෙමළ -3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 නම :———.

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : SILVA, A. B.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ඇත)

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය :————.

ස්ත්‍රී -1 පුරුෂ - 0 [ ]

අදාළ අංකය කොටුව තුළ ලියන්න

4.0 විවාහක/අවිවාහක බව :————.

අවිවාහක -1 විවාහක -2 [ ]

අදාළ අංකය කොටුව තුළ ලියන්න

5.0 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

6.0 උපන් දිනය :

වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

7.0 2008.07.04 දිනට වයස :————.

අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

8.0 තනතුර හා ශ්‍රේණිය :————.

ඉහත දැක්වෙන කරුණු නිවැරදි බවත්, ඉල්ලුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————.
අපේක්ෂකයාගේ අත්සන

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්.

ඉදිරිපත් කරමි.

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සනාථ කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
පදවි නාමය හා නිල මුද්‍රාව

දිනය :————.

05-369

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.